විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

Centre for Open and Distance Learning
University of Kelaniya-Sri Lanka

# ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
# (බාහිර) - 2009

## සමාජීය විද්‍යා පීඨය

## බෞද්ධ දර්ශනය -BUPH- E1015

## භාරතීය දාර්ශනික පසුබිම හා බෞද්ධ දර්ශනයේ මූලධර්ම

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න**

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි | කාලය : පැය 03 යි

---

01. සොබාදහමෙහි අපූර්වත්වය අවබෝධ කරගැනීමෙහි ලා ආර්යයන් දක්වූ උනන්දුව ඍග් වෛදික දේවවාදයෙහි විකාශයට හේතු වූ ආකාරය පෙන්වා දෙන්න.

02. අධ්‍යාත්මික සංවර්ධනයට වඩා ලෞකිකත්වයට මුල්තැන් දුන් කාල පරිච්ඡේදයක් වශයෙන් බ්‍රාහ්මණ යුගය හඳුන්වන්න.

03. ආරණ්‍යක යුගය නව චින්තන සම්ප්‍රදායක ආරම්භය ලෙස හඳුන්වාදීමේ යුක්තිය ප්‍රකට කරන්න.

04. නියතිවාදය තහවුරු කිරීම සඳහා මක්ඛලීගෝසාලපාදයන් විසින් ඉදිරිපත් කොට ඇති හේතු සාධක පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

05. ජෛන විමුක්ති මාර්ගය සැකෙවින් පෙන්වා දෙන්න.

06. නිත්‍යාත්මයක පැවැත්ම ප්‍රතික්ෂෙප කිරීම සඳහා බුදුරජාණන් වහන්සේ විසින් ඉදිරිපත් කරන ලද සාධක හා හේතු යුක්තීන් සූත්‍ර දේශනා ඇසුරෙන් පැහැදිලි කරන්න.

07. චතුරාර්ය සත්‍යය පිළිබඳ කෙටි හැඳින්වීමක් කොට දුක්ඛ සත්‍යය බුදු දහමෙහි පදනම වශයෙන් අගය කළ හැකි දැයි විමසන්න.

08. 'බුදු දහමෙහි සුවිශේෂත්වය වන්නේ ඊට පදනම් වූ මධ්‍යම ප්‍රතිපදාවයි.' සමකාලීන දාර්ශනික මතවාදයන් සමග තුලනය කරමින් පැහැදිලි කරන්න.

09. කර්මය හා පුනර්භවය බෞද්ධ සදාචාර ධර්මයන්හි පදනම ශක්තිමත් කිරීමට ඉවහල්වන ආකාරය පෙන්වා දෙන්න.

10. පහත සඳහන් මාතෘකා අතුරෙන් <u>තුනකට (03)</u> කෙටි සටහන් සපයන්න.

    i. සංජය බෙල්ලට්ඨිපුත්ත
    ii. ආජීවක සම්ප්‍රදායය
    iii. ඍත සංකල්පය
    iv. කාලවාදය
    v. ත්‍රි ලක්ෂණය
    vi. පටිච්ච සමුප්පාදය

***************************